# 07

# ඇසළ මංගල්‍යය ආශ්‍රිත පුද පූජා



මහනුවර දළදා මාලිගාවේ වැඩ සිටින දළදා වහන්සේ බෞද්ධයන්ගේ අතිපූජනීය වස්තුවකි. උන් වහන්සේ වෙනුවෙන් ඉතා ඈත අතීතයේ සිට දළදා මාලිගාවේ විශේෂ පුද පූජා විධි රාශියක් සිදු කරනු ලැබේ. ඒ අතරින් අලුත් සහල් මංගල්‍යය, අවුරුදු මංගල්‍යය, ඇසළ මංගල්‍යය, කාර්තික මංගල්‍යය ප්‍රධාන වේ.

ඇසළ මංගල්‍යය සම්බන්ධ ව දිගු කලක් මුළුල්ලේ නොකඩවා පවත්වාගෙන එනු ලැබූ චාරිත්‍ර වාරිත්‍ර අතුරෙන් වාර්ෂික පෙරහැර චාරිත්‍රය ප්‍රධාන අංගයකි. වැස්ස වැස්සවීමේ ශක්තියක් දළදා වහන්සේට ඇතැයි යන විශ්වාසය අතීතයේ සිට ම පැවත එන්නකි. ඒ නිසා නියං කාලයට මුල පිරෙන ඇසළ මාසය මෙම පෙරහැර පැවැත්වීමට සුදුසු ම කාලය සේ සැලකේ. මෙම පෙරහැර ආශ්‍රිත ව විවිධ වූ චාරිත්‍ර විධි සහ පූජා විධි රාශියක් දක්නට ලැබේ.

ඇසළ පෙරහැර වීදි සංචාරයේ යෙදෙන අවස්ථාවේ ධාතු කරඬුව උදෙසා නැට්ටුවන් සහ බෙර වාදකයින් විසින් කවි දැක්වීම සිදු කෙරෙයි. දළදා කරඬුව රැගත් හස්ති රාජයා දළදා මාලිගාවේ වාහල්කඩින් නික්මවීමට ආසන්න අවස්ථාවේ බෙර වාදන ශිල්පීන් විසින් ශබ්ද පූජාවක් පැවැත්වීම සිදුකෙරේ. මේ ශබ්ද පූජාව පැවැත්වෙන අවස්ථාවේ දී ම දළදා මාලිගාවේ වාහල්කඩ ඉදිරිපිට මාර්ගයේ සිටින නැට්ටුවන් විසින් දළදා වහන්සේට ආශීර්වාද පතා "මංගලම් තාලය" රඟ දක්වනු ලැබේ.

"මංගලම් තාලය" රඟ දක්වන කාලය තුළ දළදා මාලිගාවේ කවි දක්වන ශිල්පීන් විසින් දළදා ප්‍රශස්ති ගායනා කරනු ලැබේ. මේ සමඟ දකුණු ඉන්දියානු තවිල් බෙරය සහ තලි වාදනය පැවැත්වේ. එම තාලයට අනුකූල ව නාගස්වරම් නළාවෙන් "දළදා වත" සින්දු වාදනය කරනු ලැබේ. දළදා මාලිගාවේ අඹරාව නමින් හැඳින්වෙන කොටස තුළ මෙම ගායන හා වාදන පවත්වනු ලැබේ.

පසු ව දළදා කරඬුව රැගත් මංගල හස්තිරාජයා අඹරාව සීමාවෙන් ඉවත් වී මහා මාර්ගයට පිවිසෙන වාහල්කඩ දෙරටුව අභියස නතර වේ. ඒ සමඟ ම නැටුම් ශිල්පීන් විසින් මංගලම් තාලය නැටුම නටා දළදා කරඬුවට දොහොත් මුදුන් දී නමස්කාර කෙරේ. දවුල්, තම්මැට්ටම් වාදකයන් විසින් කරනු ලබන ශබ්ද පූජා තූර්ය වාදනය බුදුන් වහන්සේට ආශීර්වාද පිණිස නමස්කාර සහිත ව වාදනය කොට නිමාවට පත්කරනු ලැබේ.

ඒ සමග ම පෙරහැර වීදිගත කිරීමේ කාලය අඟවා සිටින වෙඩි හඬ නිකුත් කෙරේ. මහාමාර්ගය හරස්කොට ගෙන භෛරවයන් සිටී යන පැරණි විශ්වාසයක් තිබෙන නිසා ඔවුන් මහාමාර්ගයෙන් ඉවත් කිරීමට බෙර වාදක ශිල්පීන් විසින් "භෛරව වලිනඩය" වාදනය කරනු ලැබේ. ඉන් අනතුරුව තූර්ය වාදක ශිල්පීන් විසින් ගමන් තාල පද වාදනය කරනු ලැබේ. මෙම තාලයට ගැළපෙන පරිදි හොරණෑවෙන් දළදා වත වාදනය කිරීම පිළිවෙත වේ. එයට ගැළපෙන පරිදි නැට්ටුවන් විසින් ගමන් තාල නමින් හැඳින්වෙන නර්තනය රඟ දක්වනු ලැබේ. මේ රංගනයේ දී නර්තකයන් විසින් නර්තන අනුසාරයෙන් දළදා සමිඳුට නමස්කාර කරමින් ඔවුන්ගේ අසීමිත භක්තිය පුද කෙරේ. මෙයින් අනතුරු ව නර්තකයන් විසින් ගජගා වන්නම ගමන් තාල මගින් ඉදිරිපත් කෙරේ.

මේ ආකාරයෙන් ඇසළ මංගල්‍යයේ විවිධ පූජාවිධි සඳහා අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර විධි පාරම්පරික ගුරුකුල සතු ව පවතී. පෙරහැර අවස්ථාව සඳහා බෙර වාදනය මෙන් ම නර්තනය ද ඉදිරිපත් කරනු ලබන්නේ වයසින් සහ ශිල්ප ශාස්ත්‍ර උගත්කමෙන් මුහුකුරා ගිය ශිල්පීන් විසින් පමණි.

## ක්‍රියාකාරකම්

01). පාඩම ශබ්ද නගා කියවන්න.

02). පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ශ්‍රී දළදා මාලිගාවේ වාර්ෂික ව සිදුකෙරෙන ප්‍රධාන උත්සව හතරක් නම් කරන්න.

ii. එවැනි උත්සව පැවැත්වෙන වෙනත් ස්ථාන හතරක් නම් කරන්න.

iii. ඇසළ මංගල්‍යය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

iv. පාඩමේ සඳහන් පරිදි දළදා වහන්සේ පිළිබඳ ව ජනතාව තුළ පවතින විශ්වාසය කුමක් ද?

v. බෙර වාදන ශිල්පීන් විසින් "භෛරව වලිනඩය" වාදනය කරනු ලබන්නේ ඇයි?

03. පාඩම කියවා පහත දී ඇති වචනවලට සමාන තේරුම දෙන වචනය පාඩමෙන් සොයා ලියන්න.

i. ජූලි මාසය
ii. නර්තකයන්
iii. ඇත්රජු
iv. මහමග
v. අවුරුදු පතා
vi. හඬ
vii. ඉදිරියේ

04. පහත දී ඇති උදහරණ වාක්‍ය කියවන්න.

උදහරණය :
(අ) නැට්ටුවන් හා බෙර වාදකයින් විසින් කවි කියනු ලැබේ.
(ආ) බෙර වාදක ශිල්පීන් විසින් ශබ්ද පූජාවක් පැවැත්වීම සිදුකෙරේ.

- මෙවැනි වාක්‍ය 05ක් පාඩමෙන් සොයා ලියන්න.

## භාෂා භාවිතය

01). පහත දී ඇති උදාහරණය සැලකිල්ලට ගෙන ඊට ඉදිරියෙන් ඇති හිස් කොටු පුරවන්න.

| | | | |
|---|---|---|---|
| i. | කරයි | කරනු ලැබේ | කෙරේ |
| ii. | බලයි | | |
| iii. | නටයි | | |
| iv. | සනසයි | | |
| v. | දුවයි | | |
| vi. | කඩයි | | |
| vii. | කරති | කරනු ලබති | කෙරෙති |
| viii. | බලති | | |
| ix. | නටති | | |
| x. | සනසති | | |
| xi. | දුවති | | |
| xii. | කඩති | | |

02). පහත දැක්වෙන උදාහරණ කියවා අ, ආ වාක්‍ය අතර ඇති වෙනස වටහා ගන්න.

(අ) ළමයි සතුන් ඇති කරති.
(ආ) ළමයින් විසින් සත්තු ඇති කෙරෙති.

(අ) අපි නැට්ටුවන් දැක්කෙමු.
(ආ) අප විසින් නැට්ටුවෝ දකිනු ලැබූහ.

මේ අනුව පහත "අ" තීරුවේ සඳහන් වාක්‍යයට ගැළපෙන තේරුම දෙන වාක්‍යය "ආ" තීරුවෙන් තෝරා ඔබේ අභ්‍යාස පොතේ නැවත ලියන්න.

| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
| --- | --- |
| මව දූරිය පෝෂණය කරයි. | ගොවියන් විසින් ගවයෝ බඳිනු ලබති./බැඳෙති. |
| සෙබළා රට රකියි. | ශිෂ්‍යයන් විසින් අකුරු ලියන ලදි. /ලියැවිණි. |
| ගොවියෝ ගවයන් බඳිති. | ළමයින් විසින් මල් කඩන ලදි./කැඩිණි. |
| ළමයි මල් කැඩූහ. | සෙබළා විසින් රට රකිනු ලැබේ./රැකේ. |
| ශිෂ්‍යයෝ අකුරු ලියූහ. | මව විසින් දූරිය පෝෂණය කරනු ලැබේ./කෙරේ. |
| පුන් සඳ අහස් ගැබ සරසයි. | පුන්සඳ විසින් අහස් ගැබ සරසනු ලබයි./සැරසේ. |

03). දී ඇති උදාහරණය සැලකිල්ලට ගෙන පහත සඳහන් වාක්‍ය නැවත සකස් කර ලියන්න.

උදාහරණය :

(අ) අපි ගුරුවරුන්ගේ ආශීර්වාදය ලැබුවෙමු.

(ආ) අප විසින් ගුරුවරුන්ගේ ආශීර්වාදය ලබන ලදි.

i. මම නවකතා පොතක් මිල දී ගත්තෙමි.

.............................................................................................

ii කුරුල්ලෝ මිහිරි ගීත ගැයූහ.

.............................................................................................

iii. ගොවියෝ රට නැගුමට උදව් දෙති.

.............................................................................................

iv. අපි සෙල්ලම් ගෙවල් සෑදුවෙමු.

.............................................................................................

v. බල්ලෝ හාවුන් අල්ලති.

.............................................................................................

04). දී ඇති උදාහරණය සැලකිල්ලට ගෙන පහත සඳහන් වාක්‍ය නැවත සකස්කර ලියන්න.

උදාහරණය :

(අ) මව්පියන් විසින් දරුවෝ සනසනු ලබති./සැනසෙති.

(ආ) මව්පියෝ දරුවන් සනසති.

i. රජය විසින් රට වැසියෝ ආරක්ෂා කෙරෙති.

..........................................................................................

ii. ගුරුතුමිය විසින් මම පන්ති නායකයා ලෙස පත්කරනු ලැබීමි.

..........................................................................................

iii. බැතිමතුන් විසින් දෙවියෝ පිදෙති.

..........................................................................................

iv. ගායිකාව විසින් ගීතය ගායනා කරන ලදි.

..........................................................................................

v. ටී.බී. ඉලංගරත්න මහතා විසින් "අඹ යාළුවෝ " ළමා කතාව ලියන ලදි.

..........................................................................................

vi. ළමයා විසින් රචනාව ලියන ලදි.

..........................................................................................